ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

60 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2019 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 செப்டம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2019

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

10 ශ්‍රේණිය
*Grade 10*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවරැදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- (iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.
- (iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

01. ව්‍යාපාර බිහිවීමට ප්‍රධාන පදනම සැලසී ඇත්තේ,
01. උපකාරක සේවා 02. භාණ්ඩ හා සේවා 03. ලාභය හා තෘප්තිය 04. අවශ්‍යතා හා වුවමනා

02. ව්‍යාපාරයක විවිධ අරමුණු පවතී. ඒ අතුරින් ව්‍යාපාරයක අරමුණක් නොවන්නේ,
01. සමාජ සේවා සුබ සාධනය 02. සේවක ආදායම උපරිම කිරීම
03. රැකියා උත්පාදනය 04. අයිතිකරුවන්ගේ පෞද්ගලික තෘප්තිය

03. අවශ්‍යතා පොදු හා සීමිත වේ. වුවමනා,
01. ගණනය කළ නොහැක. 02. විවිධ හා සරල වේ. 03. අසීමිත වේ. 04. විවිධ හා අසීමිත වේ.

04. නිෂ්පාදක සාධක ලෙස සලකනුයේ,
01. ශ්‍රමය, ප්‍රාග්ධනය, නව්‍යතා, අවදානම්. 02. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, නව්‍යතා
03. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය 04. භූමිය, ප්‍රාග්ධනය, වැටුප, අවදානම්

05. පහත දැක්වෙනුයේ ව්‍යාපාර පරිසරය අධ්‍යනයෙන් හඳුනාගත හැකි ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන කිහිපයකි.
1. බදු සහන බදු විරාම 2. පුහුණු සේවකයෝ 3. සුවිශේෂී නිෂ්පාදන ක්‍රම 4. ස්වාභාවික ආපදා
5. අධිවේගී මාර්ග 6. තරගකාරිත්වය 7. පිළිගත සන්නම් නාමය 8. යහපත් භූගෝලීය පිහිටීම

ඉහත දෑ අතරින් ශක්තීන් A කාණ්ඩයේ අවස්ථා B කාණ්ඩයේත් නිවැරදිව දක්වා ඇත්තේ,
01. A - 1, 2, 5 B - 3, 6, 8 02. A - 2, 3, 7 B - 1, 5, 8 03. A - 3, 7, 8 B - 1, 6, 8 04. A - 2, 7, 1 B - 4, 6, 5

06. පහත සංවිධාන අතරින් ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානය වනුයේ,
01. රාජ්‍ය සමාගම් 02. හවුල් ව්‍යාපාර 03. දෙපාර්තමේන්තු 04. සමුපකාර සමිති

07. හවුල් ව්‍යාපාරයක සිටිය යුතු උපරිම සාමාජික සංඛ්‍යාව සඳහන් වන පණත වනුයේ,
01. 2007 අංක 7 දරණ සමාගම් පණත 02. 1890 හවුල් ආඥා පණත
03. 1840 වංචා වැළැක්වීමේ ආඥා පණත 04. 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පණත

08. රාජ්‍ය සංස්ථා ආරම්භ කළ යුත්තේ,
01. පොදු පණතක් යටතේ ය. 02. විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පණතක් යටතේ ය.
03. අතුරු අයවැයක් මගින් ය. 04. 2007 අංක 7 දරණ සමාගම් පණත යටතේ ය.

09. ව්‍යාපාර නාම ආඥා පණත අදාල වන්නේ,
01. තනි පුද්ගල ව්‍යාපාර වලට පමණි. 02. තනි හා හවුල් ව්‍යාපාර වලට පමණි.
03. හවුල් ව්‍යාපාර වලට පමණි 04. සමාගම් වලට පමණි.

10. විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග කිහිපයක් පහත වේ.

A - කේවල ස්වාමි ව්‍යාපාර B - හවුල් ව්‍යාපාර C - සීමිත පොදු සමාගම් D - සීමිත පෞද්ගලික සමාගම්

ලාභ ලැබීම අරමුණ වුවද පෞද්ගලික අංශයට අයත් නීතිමය පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධාන වන්නේ,

01. A, B 02. A, C 03. A, D 04. C, D

11. ගෝලීයකරණය යනුවෙන් අදහස් වනුයේ,

1. භෞතික වශයෙන් ලෝකය කුඩා වීමේ ක්‍රියාවලියයි.
2. වෙළෙඳාම සඳහා රටවල් එකතුවීමේ ක්‍රියාවලියයි.
3. රටවල් අතර ආර්ථික, සංස්කෘතික වශයෙන් ඇති අන්‍යෝන්‍ය බැඳීමයි.
4. ලෝකයේ පවතින රටාවට එරෙහිව සටන් කිරීම සඳහා රට රටවල්වල වෘත්තීය සමිති ඒකරාශීවීමේ ක්‍රියාවලියයි

❖ පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්ණ අංක 12 හා 13 ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

තම මවගේ පළපුරුද්ද හා අත්දැකීම් මත සුමනා විසින් පාසල් නිල ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. එම ව්‍යාපාරය "සුමන ටේලර් ෂොප්" ලෙස නම් කරන ලද අතර ව්‍යාපාරය ආරම්භයේ දී ම සුමනා විසින් තම ව්‍යාපාරය රක්ෂණය කරන ලදි.

12. මෙම ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන වුවමනාවක් වනුයේ,

01. අධ්‍යාපනය 02. ඇඳුම් 03. පාසල් නිල ඇඳුම් 04. රක්ෂණය

13. මෙහි සුමනා සතුව පවත්නා වු ශක්තියක් වනුයේ,

01. ව්‍යාපාරය රක්ෂණය කැ තිබීම. 02. පාසල් නිළ ඇඳුම් අළෙවි කිරීම
03. තම මවගේ අත්දැකීම් හා පළපුරුද්ද 04. ව්‍යාපාරය "සුමන ටේලර් ෂොප්" ලෙස නම් කිරීම

14. ආර්ථික පරිසරයට අයත් සාධක ඇතුළත් කාණ්ඩය නොවනුයේ,

1. පොලී අනුපාතය, ඉතුරුම්, දුගී බව
2. ජිවන වියදම, රැකියා වියුක්තිය, ජාත්‍යන්තර සබඳතා
3. උද්ධමනය, මිල මට්ටම, පෞද්ගලීකරණය, ඉතුරුම්
4. විදේශ විනිමය අනුපාත, ඉතුරුම්, ආදායම් ව්‍යාප්තිය, රැකියා සුලභතාවය

15. ව්‍යාපාර කටයුතුවලට බලපෑම් ඇති කරන විද්‍යුත් තැපැල, ණයපත්, අන්තර් ජාලය ආදිය ක්‍රියාත්මක වන පරිසර සාධකය කුමක් ද?

01. තාක්ෂණික පරිසරය 02. නෛතික පරිසරය 03. ආර්ථික පරිසරය 04. ගෝලීය පරිසරය

16. "සුවනෙත වෛද්‍ය මධ්‍යස්ථානය" "SUWANETHA MEDICAL CENTRE" අයත් වන්නේ,

1. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකට ය. 2. සේවා සපයන ව්‍යාපාරයකට ය.
3. භාණ්ඩ අළෙවිකරන ව්‍යාපාරයකට ය. 4. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකට ය.

17. ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වනුයේ,

01. කළමණාකරුවන්ට අවශය තොරතුරු ලබා දීම
02. ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීමට අවශය තොරතුරු ලබා දීම.
03. ව්‍යාපාරයේ ලාභය දැන ගැනිම
04. පිරිවැය හා මූල්‍ය පාලනය.

18. පහත දැක්වෙනුයේ ගිණුම්කරණ මූලිකාංගවල නිර්ණායක හා ලක්ෂණ කිහිපයකි.

A - පිරිවැය හෝ අගය විශ්වාසදායි ලෙස මැනිය හැකි විම.
B - අතීත ගනුදෙනුවක හා සිදුවීමක ප්‍රතිඵලයක් විම
C - වර්තමානයේ ව්‍යාපාරය සතු බැඳීමකි.
D - අනාගතයේ ව්‍යාපාරය තුළට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ නම්‍යතාවයක් තිබීම.

ඉහත දෑ අතරින් වත්කමකට අදාල නිර්ණායක වනුයේ,

01. A හා D 02. A, B හා D 03. A පමණි. 04. ඉහත සියල්ල ම.

19. පහත දැක්වෙනුයේ ගිණුම් වර්ග කිහිපයකි. ඒ අතුරින් වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ගිණුම් පිළිවෙළට ඇතුළත් වනුයේ,
01. තොගය, ණය පොළී, විකුණුම්, ලැබිය යුතු පොළී.
02. ලැබිය යුතු ණය පොළී, කලින් ලද ගෙවල් කුලි, ලද පොළී, ණය පොළී
03. ලද පොළී, කලින් ගෙවූ ගෙවල් කුලි, ණය පොළී, විදුලිය
04. තොගය, බැංකු ණය, කලින් ලද ගෙවල් කුලි, රක්ෂණය

20. අයිතිකරුගේ හිමිකම වෙනස් වීමට බලනොපාන ගනුදෙනුව වනුයේ,
01. ආදායම්, වියදම්
02. අමතර ප්‍රාග්ධනය, ගැනීලි
03. වත්කම් ගැනීම, වගකීම්
04. ආදායම්, අමතර ප්‍රාග්ධනය

21. ව්‍යාපාරයක සිහිවටන තීරු ලෙස සැලකෙනුයේ,
01. ලද වට්ටම්, දුන් වට්ටම්
02. වෙළෙඳ වට්ටම්
03. වෙළෙඳ වට්ටම්, මුදල් වට්ටම්
04. වෙළෙඳ වට්ටම්, දුන් වට්ටම්, ලද වට්ටම්

❖ චමල් විසින් ලාහිරු සමාගමෙන් රු 200,000 ක ලකුණු කල මිල සහිත භාණ්ඩ ණයට ගන්නා ලදි.වෙළෙඳ වට්ටම 10% කි. මෙම ණය මුදල 2019.07.31 ට පෙර පියවුවහොත් 5% ක මුදල් වට්ටමක් දෙන බවට ලාහිරු සමාගම පෙරොන්දු විය. චමල් විසින් 2019.07.25 වන දින සම්පූර්ණ මුදල පියවුයේ නම්,

22. චමල් විසින් ගෙවූ මුදල කීය ද?
01. රු. 190,000
02. රු. 180,000
03. රු. 171,000
04. ඉහත කිසිවක් නොවේ.

23. ඊට අදාලව චමල්ගේ පොත් වල තැබිය යුතු ද්විත්ව සටහන කුමක් ද?

01.
| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු.180,000 |
| ලද වට්ටම් ගිණුම | බැර | රු. 9,000 |
| මුදල් ගිණුම | බැර | රු. 171,000 |

02.
| | | |
|---|---|---|
| ණයගැති ගිණුම | හර | රු. 200,000 |
| දුන් වට්ටම් | බැර | රු. 10,000 |
| ලද වට්ටම් | බැර | රු. 190,000 |

03.
| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 200,000 |
| ලද වට්ටම් ගිණුම | බැර | රු. 20,000 |
| මුදල් ගිණුම | බැර | රු. 180,000 |

04.
| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 180,000 |
| ලද වට්ටම් | බැර | රු. 18,000 |
| මුදල් ගිණුම | බැර | රු. 162,000 |

24. ගනුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට බලපාන අයුරු පහත දැක්වේ.

| **වත්කම්** | = | **වගකීම්** | + | **හිමිකම්** |
|---|---|---|---|---|
| - 15,000 | | | | - 15,000 |

01. රු. 15,000ක බඩු තොග ණයට ගැනීම
02. රු. 15,000ක බැංකු ණය පොලිය ගෙවීම
03. රු. 15,000ක අමතර ප්‍රාග්ධනය යෙදවීම
04. රු. 15,000ක බැංකු ණය ගෙවීම.

25. පහත දැක්වෙන්නේ වෙළෙඳ ව්‍යාපාරයක ගනුදෙනුවකි.
❖ රු. 15,000ක බඩුතොග සුපුන්ට ණයට විකිණීම
මෙම ගනුදෙනුව සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන වනුයේ,

01.
| | | |
|---|---|---|
| මුදල් ගිණුම | හර | රු 15,000 |
| විකුණුම් ගිණුම | බැර | රු. 15,000 |

02.
| | | |
|---|---|---|
| සුපුන් ගිණුම | හර | රු. 15,000 |
| විකුණුම් ගිණුම | බැර | රු. 15,000 |

03.
| | | |
|---|---|---|
| මුදල් ගිණුම | හර | රු 10,000 |
| සුපුන් ගිණුම | බැර | රු. 10,000 |

04.
| | | |
|---|---|---|
| සුපුන් ගිණුම | හර | රු. 15,000 |
| මුදල් ගිණුම | බැර | රු. 15,000 |

26. මුදල් වට්ටම් වනුයේ,
01. වෙළෙඳ වට්ටම්
02. දුන් වට්ටම්, ලද වට්ටම්
03. දුන් වට්ටම්, වෙළෙඳ වට්ටම්
04. වෙළෙඳ වට්ටම්, මුදල් වට්ටම්

27. පහත සඳහන් ලෙජර් ගිණුම් ශේෂවල දැකිය හැකි අසාමාන්‍ය අයිතමය කුමක් ද?
01. ණයගැතියකුගේ ගිණුමේ බැර ශේෂයක් පෙන්වීම
02. ලැබූ වට්ටම් ගිණුමේ බැර ශේෂයක් පෙන්වීම
03. බැංකු ණය ගිණුමේ බැර ශේෂයක් පෙන්වීම
04. ආයෝජන ගිණුමේ හර ශේෂයක් පෙන්වීම.

28. ගිණුම් පොත්වල සටහන් කළ හැකි ව්‍යාපාරික ගනුදෙනුව කුමක් ද?
01. ව්‍යාපාරයට කළමණාකරුවෙකු බඳවා ගැනීමට තීරණය කිරීම
02. පිරිවැටුම වැඩිකරලීමට පියවර ගැනීම.
03. ලාභය සමව බෙදා ගැනීමට ලිඛිතව එකග වීම.
04. රු. 50,000ක මාසික වැටුප් ගෙවීම.

29. ජංගම වත්කම් පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.
01. බඩුතොගය, ණයගැතියෝ, බැංකු මුදල් 02. ප්‍රාග්ධනය, බැංකු ණය, ගැනිලි
03. මෝටර් රථ, ලී බඩු, යන්ත්‍ර උපකරණ 04. ණයහිමියෝ, බැංකු අයිරාව, උපචිත වියදම්

30. දර්ශා තම ව්‍යාපාරයට රු. 20,000ක ලී බඩු උපකරණ ණයට ගනී. මෙම ගනුදෙනුව නිසා සිදු වුයේ,
01. වත්කම් හා හිමිකම් වැඩිවීම ය. 02. වත්කම් හා වගකීම් වැඩිවීම ය.
03. වත්කම් හා හිමිකම් අඩු වීම ය. 04. වත්කම් හා වගකීම් අඩුවීම ය.

31. ගිණුමක කාර්ය ඉටුකරන මූලික පොත වන්නේ,
01. පොදු ජ්'නලය 02. ගැණුම් ජ්'නලය 03. විකුණුම් ජ්'නලය 04. මුදල් පොත

32. ගිණුමක හර පැත්ත බැර පැත්තට වඩා වැඩි වේ නම් ලැබෙන ශේෂය,
01. හර ශේෂය කි. 02. බැර ශේෂයකි. 03. අතිරික්තය කි. 04. ශුන්‍ය වේ.

33. කල්හාරගේ ව්‍යාපාරයේ 2019.01.01 දිනට පහත තොරතුරු ඔබට සපයයි.

| | | | |
|---|---|---|---|
| අත ඉතිරි මුදල | රු. 50,000 | බැංකු මුදල් | රු. 30,000 |
| ණයගැතියෝ | රු. 20,000 | බැංකු ණය | රු. 40,000 |
| ණයහිමියෝ | රු. 10,000 | | |

2019.01.01 දිනට ව්‍යාපාරයේ අයිතිකරුගේ හිමිකම කොපමණ ද?
01. රු. 30,000 කි. 02. රු. 50,000 කි. 03. රු. 60,000 කි. 04. රු. 90,000 කි.

34. ව්‍යාපාරයක බැංකු ණය වාරිකය සමග පොලිය ද ගෙවූ විට ගිණුම් සමීකරනයට ඇති වන බලපෑම වනුයේ,
01. වත්කම් වැඩි වී වගකීම් වැඩි වේ. 02. හිමිකම් අඩු වී වත්කම් හා වගකීම් ද අඩු වේ.
03. හිමිකම් වැඩි වී වත්කම් හා වගකීම් ද වැඩි වේ. 04. වගකීම් වැඩි වී හිමිකම අඩු වේ.

35. සෑම විටම හර ශේෂයක් පෙන්වන ගිණුම වන්නේ,
01. උපචිත විදුලිය ගිණුම 02. විකුණුම් ගිණුම 03. පොලී ආදායම් ගිණුම 04. ණයගැති ගිණුම

36. අඩුවීම හර, වැඩිවීම බැර යන ගිණුම්කරණ මූලධර්මය පෙන්වන ගිණුම් දෙක වන්නේ,
01. පොලී ආදායම් ගිණුම හා දුන් වට්ටම් ගිණුම ය 02. රක්‍ෂණ ගාස්තු ගිණුම හා විදුලිය ගාස්තු ගිණුම ය.
03. ප්‍රාග්ධන ගිණුම හා ණයහිමි ගිණුම ය. 04. බැංකු ගිණුම හා ණයගැති ගිණුම ය.

ණයගැතියන්ගෙන් මුදල් ලබා ගැනීමේ දී ලැබිය යුතු වටිනාකමින් කෙරෙන අඩු කිරීම (1)............... වට්ටම් ලෙස හඳුන්වන අතර ණයහිමියන්ට මුදල් ගෙවීමේ දී ගෙවිය යුතු වටිනාකමින් කෙරෙන අඩු කිරීම් (2).............. වට්ටම් ලෙස හඳුන්වයි.
ඉහත ප්‍රකාශණයේ අංක 1 හා 2 යන ස්ථාන වලට අදාල යෙදුම් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
01. වියදම් හා ආදායම් 02. දුන් වට්ම් හා ලද වට්ටම්
03. ලද වට්ටම් හා දුන්වට්ටම් 04. ආදායම්, වියදම්

37. පහත සඳහන් කරුණු වලින් ණයහිමි ගිණුමේ ඇතුළත් නොවන්නේ කුමක් ද?
01. ආරම්භක ශේෂය 02. වෙළෙඳ වට්ටම් 03. ලද වට්ටම් 04. ණයහිමියන්ට ගෙවීම්

38. ණයට විකුණුම් සම්බන්ධ නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?
01. විකුණුම් ගිණුම හර - ණයගැති ගිණුම බැර 02. ණයගැති ගිණුම හර - විකුණුම් ගිණුම බැර
03. විකුණුම් ගිණුම හර - මුදල් ගිණුම බැර 04. මුදල් ගිණුම හර - විකුණුම් ගිණුම බැර

39. මුදල් වට්ටම් සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
01. මුදල් වට්ටම් දුන් වට්ටම් හා ලද වට්ටම් ලෙස වර්ග 2කි.
02. මුදල් වට්ටම් ඇතිවන්නේ ණය බේරුම් කරන විට ය.
03. භාණ්ඩ මිලදී ගැනීමේ දී මෙන්ම විකිණීමේ දී මුදල් වට්ටම් ලබා දෙයි.
04. මුදල් වට්ටම් ගිණුම්වල සටහන් කෙරේ.

40. පහත ගනුදෙනු අතරෙන් හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුව වනුයේ,
01. අයිතිකරු තම පෞද්ගලික පරිභෝජනය සඳහා රු. 10,000ක් ව්‍යාපාරයෙන් ලබා ගැනීම.
02. රු. 2,000ක් විදුලිය ගෙවීම.
03. අයිතිකරු රු. 10,000ක් අතිරේක ප්‍රාග්ධනය ලෙස යෙදවීම.
04. රු. 300,000 වටිනා යන්ත්‍රයක් මිලදී ගැනීම.

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.